දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650, 011-2136700
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011- 2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E - mail: info @psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
No. 1200/9, Rajamalwatta Road, Battaramulla

මගේ අංකය / எனது இல. / My No.: PSC/APL/12/35/2022
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.12. 02

**ලේකම්,**

සෞඛ්‍ය අමාත්‍යාංශය.

**<u>ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන්ගේ 2021 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති ප්‍රති-අභියාචනාවලට අදාළ තීරණ දැනුම් දීම</u>**

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන්ගේ 2021 වාර්ෂික ස්ථාන මාරු නියෝගවලට එරෙහිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද ප්‍රති-අභියාචනාවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ මේ සමඟ ඔබ වෙත එවමි.

02. එක් එක් නිලධාරියා සම්බන්ධයෙන් වෙන වෙනම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණ දන්වා එවීමට කටයුතු කරනු නොලැබේ. ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා වෙබ් අඩවියේ ස්ථාන මාරු අභියාචනයන්ට අදාළ නියෝග ප්‍රසිද්ධ කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර මේ සම්බන්ධයෙන් 2006 අංක 19 දරණ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනතේ 2 (ඇ) සහ (ඈ), 3 සහ 4 යන වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කරනු ලැබේ.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණයකින් අතෘප්තියට පත්වන රජයේ නිලධරයකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනතේ විධිවිධානවලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය. එසේ වුවද, ඉදිරිපත් කරනු ලබන අභියාචනා සඳහා පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරයේ අවසන් තීරණයක් ලැබෙන තෙක් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය එලෙසම ක්‍රියාත්මක විය යුතු බවද කාරුණිකව දැනුම් දෙමි.

04. වාර්ෂික ස්ථාන මාරු නියෝග මත නියමිත පරිදි නව සේවා ස්ථාන වෙත රාජකාරි සඳහා වාර්තා නොකර සිටින නිලධරයකු සම්බන්ධයෙන් එම නිලධාරියා ස්ථාන මාරුව ලබා ඇති ආයතනයේ ප්‍රධානියා විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 217 වගන්තිය අනුව, තනතුර අතහැර යාමේ නිවේදනයක් නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ආයතන ප්‍රධානීන් එසේ කටයුතු කරන්නේද යන්න පිළිබඳව ඔබ විසින් අධීක්ෂණය කළ යුතු වේ.

05. මින් ඉදිරියට ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ශ්‍රේණිගත වෛද්‍ය නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේදී මාගේ සමාංක සහ 2022.10.04 දිනැති ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව, අදාළ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාවලිය විධිමත් පරිදි සිදු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

06. එසේම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණ ලබා දී ඇති ස්ථාන මාරු සම්බන්ධව ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හෝ නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නැවත සලකා නොබලන බව දන්වන අතර එවැනි ඉල්ලීම් හා නිර්දේශ තවදුරටත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් නොකරන ලෙසද වැඩිමනත් කාරුණිකව දන්වනු කැමැත්තෙමි.

**එම්.ඒ.බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

පිටපත් - (01) ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව - දැ. ගැ. පි. සහ අ.ක. ස.

(02) ආයුර්වේද කොමසාරිස්, ආයුර්වේද දෙපාර්තමේන්තුව - දැ. ගැ. පි. සහ අ.ක. ස.

ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ශ්‍රේණිගත වෛද්‍ය නිළධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - **2021** - ප්‍රති අභියාචනා

| අනු අංකය | නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභා තීරණය |
|---|---|---|---|---|---|
| 1 | කේ.ජී.ජිනසේන මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | දඹවින්න ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව | ස්ථාන මාරු ලබා දී නොමැත | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 2 | එස්.එම්.ආර්.එම්.කරුණාරත්න මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ග්‍රාමීය ආයුර්වේද රෝහල පදවිය | මින්නේරිය මූලික ආයුර්වේද රෝහල | මීලග වාර්ෂික ස්ථාන මාරුවීම් ලබාදීමේදී ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරුව ලබා දීමට ප්‍රමුඛතාවය ලබා දීමට යටත්ව අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 3 | බී.ජයන්තිනී මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ග්‍රාමීය සිද්ධ රෝහල කරවෙඩ්ඩි | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව සරසලායි | නිළධාරිණියගේ වයස අවු.59 සම්පූර්ණ වීම හේතුවෙන් නිළධාරිණිය දැනට සේවය කරන සේවා ස්ථානයේ රැදී සිටීමට අවස්ථාව ලබා දීම |
| 4 | ජී.ජී.එල්.ජී. විජේසූරිය මයා | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ඇළහැර ප්‍රා.ලේ කොට්ඨාශය - ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | ස්ථාන මාරු ලබා දී නොමැත | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 5 | එල්.ටී.පී.සී.වෛද්‍යාරත්න මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | පලුගස්වැව ප්‍රා.ලේ කොට්ඨාශය - ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී | මධ්‍යම බෙහෙත් ශාලාව හීනටියන | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |
| 6 | එල්.ඒ.ඩබ්ලිව්.පුෂ්ප කුමාරි මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ඉඹුල්ගොඩ නිදහස් බෙහෙත් ශාලාව | ආනියාකන්ද ආයුර්වේද රෝහල | නිළධාරිණිය මේ වන විට වයස අවු.60 සම්පූර්ණ කර ඇති බව නිරීක්ෂණය කරන ලදුව අභියාචනය සලකා බැලිය නොහැකි බව |
| 7 | කේ.එල්.එම්. නක්ෆෙර් මයා | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | අම්පාර ආයුර්වේද පර්යේෂණ රෝහල | ස්ථාන මාරු ලබා දී නොමැත | අභියාචනය නිශ්ප්‍රභ කිරීම |

02/12/2022

02/12/2022

| අනු අංක | ආයුර්වේද වෛද්‍ය නිළධාරියාගේ නම | තනතුර | වර්තමාන සේවා ස්ථානය | ස්ථාන මාරු ලැබූ සේවා ස්ථානය | රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙ තීරණය |
|---|---|---|---|---|---|
| 8 | ආර්.එම්.උදය කුමාර මයා | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - නව මැදගම | ස්ථාන මාරු ලබාදී නොමැත | මීළඟ වාර්ෂික ස්ථාන මාරුවීම් ලබා දීමේ දී ඉල්ලුම් කරනු ලබන සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරුව ලබා දීමට යටත්ව අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 9 | අයි.ඩබ්.ජී.එන්. දිනුෂිකා මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ප්‍රාදේශීය සභා නිදහස් බෙහෙත් ශාලාව - තණමල්විල | ස්ථාන මාරු ලබාදී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 10 | ඒ.එම්.කේ.කේ.ජයශ්‍රී මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - දෙහිඅත්තකණ්ඩිය | ස්ථාන මාරු ලබාදී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 11 | ඩබ්.ජී.ඩී ශානිකා මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ආයුර්වේද මධ්‍යයම බෙහෙත් ශාලාව - ලුණුවත්ත | ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී - සොරණාතොට | අභියාචක ස්ථාන මාරු කරනු ලබන තනතුර බෝලියැද්ද කාර්ය භාර වෛද්‍ය නිලධාරී ලෙස සංශෝධනය කිරීම |
| 12 | කේ.ජී.එස්.රණසිංහ මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | මූලික ආයුර්වේද රෝහල - මින්නේරිය | ස්ථාන මාරු ලබාදී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 13 | ඩබ්.ඩී.එස්. ද සොයිසා මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - හාලිඇල | ස්ථාන මාරු ලබාදී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 14 | ඒ.වී.එස්.විතාරන මිය | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ආයුර්වේද මහ රෝහල - දියතලාව | ස්ථාන මාරු ලබාදී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 15 | අයි.වයි.ජී.එම්.එස්.සුමනවීර මයා | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | දිස්ත්‍රික් ආයුර්වේද රෝහල - දෙහිඅත්තකණ්ඩිය | ස්ථාන මාරු ලබාදී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |
| 16 | යූ.කේ.එස්. දිලූෂ මයා | ආයුර්වේද වෛද්‍ය නිලධාරී | ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව - වැලිමඩ | ස්ථාන මාරු ලබාදී නොමැත | අභියාචනය නිෂ්ප්‍රභ කිරීම |

22/12/2022